# කලාප අධ්‍යාපන කාර්යාලය - මාතර

## සමාජ විද්‍යා තරගාවලිය - 2018

## 7 ශ්‍රේණිය

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම :- ......................................................................

පාසල :- ......................................................................

කොට්ඨාසය :- ......................................................................

පාසල් වර්ගය :- ........................................................ කාලය පැ. 1 වි. 15

---

✡ **01 සිට 10 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(ලකුණු 2 x 10= 20)

01. අතීත ලංකාවේ සෙල්ලිපි වල හේන හැඳින්වීමට භාවිතා කර ඇති වචනය කුමක්ද?
1. සේන් 2. හේන් 3. පිටබිම් 4. නවදැලි හේන

02. හේන් වල වගා කල කටුසර බෝග ගනයට අයත් නොවන බෝගය කුමක්ද?
1. මෙනේරි 2. තණහාල් 3. ඇල් වී 4. කුරක්කන්

03. ගැල් මීවුන් ලෙස අතීතයේ හැඳින්වූයේ,
1. කිරි ලබා ගැනීම සඳහා ඇතිකල ගවයන් ය
2. ප්‍රවාහන කටයුතු වලට කරත්ත සඳහා යොදාගන්නා ගවයන් ය
3. ගොයම් පෑගීම සඳහා යොදාගත් ගවයන් ය
4. සී සෑමේ කටයුතු වලට යොදාගත් ගවයන් ය

04. ලංකාවේ භාවිතා කර ඇති මුල්ම කාසි විශේෂය ලෙස සැලකෙන්නේ කුමක්ද?
1. අලියා සහ ස්වස්තිකය කාසිය 2. තඹ මස්ස
3. රිදී පනම 4. හස්ඵබු කහා පණ කාසිය

05. වෙළඳ පොළ අකටයුතු කම් පාලනය සඳහා බදුලු වැම් ලිපිය පිහිට වූ රජතුමා වන්නේ,
1. V මිහිදු රජතුමා 2. IV උදය රජතුමා 3. II සේන රජතුමා ය 4. I කාශ්‍යප රජතුමාය

06. තම මවට ඉතාමත් ගෞරවයෙන් ආදරයෙන් ඇප උපස්ථාන කරන ලද රජෙකු මහාවංශයේ සඳහන් වේ. එම රජතුමා කවුද?
1. දුටුගැමුණු රජතුමා ය 2. I විජයබාහු රජතුමා ය
3. VIII වන අග්ගබෝධි රජතුමාය 4. පණ්ඩුකාභය රජතුමා ය

07. ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශයේ රාජ්‍යත්වය ලබා ගැනීම සඳහා ලංකාවේ II සේන රජ කළ ආධාර ඉල්ලා මෙරටට පැමිණි පාණ්ඩ්‍ය කුමාරයා වූයේ,
1. දෙවන වරගුණවර්මන් කුමරු 2. මානවම්ම කුමරු ය
3. මාර ශ්‍රී වල්ලභ කුමරුය 4. කාලිංග මාඝ ය

08. පෘථිවි ගෝලයේ සමක විශ්කම්භය හා ධ්‍රැව විශ්කම්භය අතර වෙනස වන්නේ,
1. 41 km 2. 43 km 3. 42 km 4. 44 km

09. පෘථිවි ආදර්ශ ගෝලයේ ඇති මුළු අක්ෂාංශ ගණන හා මුළු දේශාංශ ගණන පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. 90 , 180
2. 360 , 180
3. 180 , 360
4. 180 , 90

10. " දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු" යන සිරිත් මල් දමෙහි සඳහන් කවියේ හතර වන පදය වන්නේ,

1. එබැවින් නිතින් මේ දෙවියන් වැද ගනිමු
2. බැලුමෙන් හොඳින් ගුරු දෙගුරුන් රැක ගනිමු
3. උතුමන් බසින් ඉටු දෙවියන් වැද ගනිමු
4. නිතියෙන් සිතින් සැම දෙවියන් වැද ගනිමු.

✡ **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට එම සඳහන් වාක්‍යයේ අදහස හරි නම් ✓ ලකුණද වැරදි නම් × ලකු ඉදිරියේ ඇති වරහණ තුළ යොදන්න.**

11. නිවසක මව පියා හා දරුවන් එක්ව වාසය කරන්නේ නම් එය න්‍යෂ්ටික පවුලක් ලෙස හඳුන්වයි. (..................)

12. කුමන ආගමක් ඇදහුවද ඉන් බලාපොරොත්තු වන මූලික අරමුණ වන්නේ පුද්ගලයන් සුමඟට යොමු කි හා යහපතෙහි පිහිටුවීමයි. (..................)

13. ලෝකයේ විශාලම මහාද්වීපය ආසියා මහාද්වීපය වන අතර විශාලම සාගරය පැසිෆික් සාගරය වෙයි. (..................)

14. " අති අදික " ලෙස අතීතයේ ක්‍රියා කර ඇත්තේ අශ්වයන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියාය (..................)

15. පොළොන්නරුව රාජධානියේ ප්‍රථම රජතුමා වූයේ I විජයබාහු රජතුමාය . (..................)

✡ **16 සිට 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

( ලකුණු 2 x 5

16. නිශ්ශංක මල්ල රජු විසින් කරන ලද රජ පවුලේ අයගේ බරට සමාන වස්තුව දන්දීම .................................................. ලෙස හඳුන්වයි.

17. මහා පරාක්‍රම බාහු රජුගේ පියා .................................................. විය.

18. ශ්‍රී ලංකාව හා ඉන්දියාව වෙන් වී ඇති ඉතා පටු නොගැඹුරු මුහුදු තීරය .................................................. ලෙස හඳුන්වයි.

19. ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් හා ආගම් අදහන අය එකට වාසය කරන බැවින් එය .................................................. රටක් ලෙස හඳුන්වයි.

20. ඔබගේ පියාගේ මල්ලී ඇමතීමට ඔබ .................................................. යන ඇමතුම් පදය භාවිතා කළ යුතුයි.

✡ **21 සිට 25 ප්‍රශ්න වලට අදාල පිළිතුරු සපයන්න.** ( ලකුණු 4 x 5 = 20 )

21.



(i) මෙම නිර්මාණය කුමක්ද?

..................................................................


..................................................................

(ii) මෙය මගින් අපේක්ෂිත කාර්ය කුමක්ද?

..................................................................

..................................................................

22.





(i) $O^0$ ලෙස දැක්වෙන රේඛාව කුමක්ද?

..................................................................

(ii) A රේඛාව නම් කරන්න.

..................................................................

23.




(i) රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

..................................................................

(ii) මෙය පිහිටා ඇති ස්ථානය කුමක්ද?

..................................................................

24.




(i) මෙම කලාපය හැඳින්වෙන්නේ කුමන නමකින්ද?

..................................................................

(ii) A අක්ෂරයෙන් දැක්වෙන රට නම් කරන්න.

..................................................................

..................................................................

25.



(i) මෙම රූපයේ දැක්වෙන චිත්තවේගී තත්ත්වය කුමක්ද?

..................................................................

(ii) එම තත්ත්වය තුල දැකිය හැකි ඉරියව්වක් සඳහන් කරන්න.

..................................................................

✡ **26 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** ( ලකුණු 2 + 3 x 5 = )

26. (i) වී වගා කරන ප්‍රධාන කන්නයක් නම් කරන්න.

..............................................................................................................

(ii) වී වගා කිරීමට අවශ්‍ය ප්‍රධාන සාධක 3 ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

27. (i) පහත අතීත වරාය හඳුන්වන වර්තමාන නම ඉදිරියෙන් ලියන්න.

ගෝකණ්ණ - ..............................................................................

(ii) අතීතයේ විදේශීය රට වලින් ආනයනය කළ ද්‍රව්‍ය තුනක් නම් කරන්න.

..............................................................................................................

28. (i) ක්‍රි.ව. 10 සියවසේ පැවති නීති රීති පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය කුමක්ද?

..............................................................................................................

(ii) එකල පැවති නීති වර්ග 3 ක් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

29. (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන අගනුවර කුමක්ද? ..............................................

(ii) පහත රටවල මුදල් ඒකක නම් කරන්න.

- ඇමරිකාව - ..............................................
- ඉන්දියාව - ..............................................
- බ්‍රිතාන්‍යය - ..............................................

30. (i) වර්තමානයේ ලංකාවට දැඩිව බලපා ඇති ස්වභාවික විපත කුමක්ද?

..............................................................................................................

(ii) ස්වාභාවික විපත් ඇතිවීමට බලපා ඇති මිනිස් ක්‍රියාකාරකම් 3 ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

✡ **පහත සඳහන් ශ්‍රී ලංකා සිතියමේ දී ඇති ස්ථාන 5 ලකුණු කර නම් කරන්න.**

( ලකුණු 3 x 5 = 15)


31. මහනුවර

32. ත්‍රිකුණාමලය

33. දඹකොළපටුන

34. දේවනගර්

35. කොළඹ





LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න